කින්නියා නගර සභාව
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
-----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 ජූලි 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 සැප්තැම්බර් 11 දිනද කළමනාකරණ විගණන වාර්තාව 2019 නොවැම්බර් 06 දිනද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 අභිතකර මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කින්නියා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව, සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බැව් මා දරන්නාවූ මතය වේ.

## 1.3 අභිතකර මතය සඳහා පදනම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂ පත්‍ර ශේෂය රු.4,215,395 ක් වුවත්, 2018 ජනවාරි 01 දිනට එම ශේෂය ගිණුම්වලට ගෙන ඒමේදී රු.4,244,628 ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂ ඉදිරි වර්ෂවලට ගෙන යාමේදී ශේෂවල නිවැරදිතාවය තහවුරු කළ යුතුය. තවද, ගලපනු ලැබූ ගිණුම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. | වැරදීමකින් ඉදිරියට ගෙන එනු ලැබූ සේවක ණය ආරම්භක ශේෂය නිවැරදි කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි රු.3,954,242 ක පිරිවැයකට ඉදිකර තිබුණත්, මූල්‍ය ප්‍රකාශනවල රු.4,169,967 ක් ලෙස දක්වා ඇත. මේ අනුව රු.215,625 කින් ගොඩනැගිලි වටිනාකම වැඩියෙන් දැක්වුණි. | මෙම අඩුපාඩුව නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | ගොඩනැගිලි වටිනාකම ආදායම් ගිණුමේ නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (ඇ) | 2016 වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු රු.2,105,588 ක් සමාලෝචිත වර්ෂයේදී ලැබී | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී දෝෂ සිදු නොවන අයුරින් පිළියෙල කිරීමට | මුද්දර ගාස්තු පසුගිය වර්ෂවල උපචිත පදනමින් ගිණුම්ගත නොකර ඉදිරි වර්ෂයේ ආදායමක් |

| | | | |
|---|---|---|---|
| | තිබුණත්, මෙම ශේෂය සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත. | ක්‍රියාමාර්ග ගත යුතුය. | ලෙස ලේඛනගත කර ඇත. ඉදිරි කාලයේදී නිවැරදි කිරීමට කටයුතු කෙරේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ලංසු තැන්පතුවල ආරම්භක ශේෂය රු.7,371,118 ක් විය. ලැබී තිබූ ලංසු තැන්පතු වටිනාකම රු.3,250,571 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල ලද වටිනාකම ලෙස ආරම්භක ශේෂයද එකතු කර රු.10,627,689 ක් ලෙස සටහන් වීමෙන් එම වටිනාකමෙන් එම ශේෂය වැඩියෙන් දැක්වුණි. | වැඩියෙන් දක්වා ඇති ශේෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | ලංසු තැන්පතු ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ආපසු ගෙවන ලද රු.733,000 ක් ලංසු තැන්පතු, ලංසු තැන්පතු ශේෂයෙන් අඩු නොකළ නිසා එම වටිනාකමෙන් එම ශේෂය වැඩියෙන් දැක්වුණි. | වැඩියෙන් දක්වා ඇති ශේෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | ලංසු තැන්පතු ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ අවසාන තොග වටිනාකම රු.563,758 ක් වුවත්, තොග ලැයිස්තුව අනුව රු.440,155 ක් දක්වා තිබූ බැවින් මූල්‍ය ප්‍රකාශනවල මෙම ශේෂය රු.123,603 කින් වැඩියෙන් දැක්වුණි. | මෙම ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | තොග ලැයිස්තුව සම්බන්ධයෙන් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ සභාවේ අරමුදලින් ගෙවන ලද වැටුප් හා සභාවේ සභිකයන්ගේ දීමනා පිළිවෙලින් රු.3,387,676 ක් සහ රු.210,000 ක් වශයෙන් එකතුව රු.3,597,676 ක් පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ලැබිය යුතු වුවත්, එම වටිනාකම ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මෙම ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | වැටුප් සභාවේ සභිකයන්ගේ දීමනා අදාළ කාල වකවානුවල පළාත් පාලන කොමසාරිවරයාගේ නොලැබීම නිසා ලැබිය යුතු වටිනාකමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ රු.1,278,411 ක් ගෙවිය යුතු වුවත්, මෙම ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර | මෙම ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | සභාවේ මූල්‍ය ක්‍රියාවලියට ඇතුළත් නොවූ බැවින් (උපචිත පදනම යොදාගෙන නොතිබුණි) |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. මේ නිසා ණයහිමි ශේෂය මෙම වටිනාකමෙන් අඩුවෙන් පෙන්වා තිබුණි. | | |
| (එ) | 2017 ජුනි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාළ උසාවි දඩ මුදල් රු.7,395,666 ක් සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණත් එම මුදල් ලැබිය යුතු ලෙස උසාවි දඩ ගාස්තු ලැබිය යුතු ගිණුම්, ගිණුම්ගත කර නොතිබුණි. එම නිසා මෙම ගිණුම් ශේෂය එම වටිනාකමෙන් වැඩියෙන් පෙන්වනු ලැබිය. | මෙම ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | පසුගිය කාලපරිච්ඡේදයේ උපචිත පදනම අනුගමනය කර නොතිබුණි. |
| (ඒ) | 2017 දෙසැම්බර් 31 දින නෙල්සිප් ඇප මුදල් ශේෂය රු.1,205,344 සඳහා සමාලෝචිත වර්ෂයේ ආපසු ගෙවීම් විස්තර කිසිවක් මූල්‍ය ප්‍රකාශනවල එකතු කර නොතිබූ හෙයින්, එම ශේෂය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. මෙම නිසා ශේෂය විගණනයේදී තහවුරු කළ නොහැකි වී තිබුණි. | මෙම ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | මෙම තැන්පතු ආපසු ගෙවිය නොහැකි බවත්, මෙම තැන්පතු ශේෂය තථ්‍ය බවත් තහවුරු කරමි. |
| (ඔ) | සභාව විසින් සකස් කර ඉදිරිපත් කළ ආදායම් වියදම් ගිණුම් අනුව වර්ෂය සඳහා ඇස්තමේන්තුගත වියදම ඉක්ම වූ ආදායම රු.7,272,660 ක් විය යුතුව තිබුණි. ගිණුම්කරණ දෝෂ හේතුවෙන් රු.869,917 ක් දැක්වීම නිසා රු.6,402,743 කින් එම ශේෂය අඩුවෙන් දක්වා තිබුණි. | මෙම ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | පසුගිය කාල විගණන වාර්තාවේ අනාවරණය කිරීමට අනුව කටයුතු කරමින් තිබේ. |
| (ඕ) | සමාලෝචිත වර්ෂයේ ආදායම් වියදම් ගිණුම අනුව සමුච්චිත අරමුදලට මාරු කළ යුතු රු.7,272,660 ක් වෙනුවට රු.869,917 ක් මාරු කිරීම නිසා රු.6,402,743 ක් ශේෂ පත්‍රයේ හෙළිදරව් කර නොතිබුණි. | මෙම ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | ආදායම් වියදම් ගිණුම අනුව සමුච්චිත අරමුදලට ගෙන ගොස් ඇත. ගැලපීමට කටයුතු කර ඇත. |

### 1.3.2 අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවිනිශ්චිත ගිණුමෙහි දිගින් දිගටම රු.29,358,517 ක බැර ශේෂයක් පෙන්නුම් කෙරිණි. මේ සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුම් ශේෂ සඳහා හේතු හඳුනාගෙන ඒවාට උචිත ගිණුම් තැබීම් ද හඳුනාගෙන කපාහැරීමට කටයුතු කළ යුතුය. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.29,358,517 ක් වුවත් දැනට රු.24,611,595 ක් දක්වා අඩුකර ඇත. මේවා ඉදිරියේදී හඳුනාගෙන ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.34,662,926ක් වටිනා ගිණුම් විෂයයන් 05ක් තහවුරු කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. | සඳහන් කර ඇති ගිණුම් විෂයයන් 05 සම්බන්ධයෙන් වස්තරාත්මක උපලේඛන සහ කාල විශ්ලේෂණය ඉදිරියේදි සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති. රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නගර සභා ආඥා පනතේ 177 (2) වගන්තිය (පරිශිෂ්ඨය 255) | සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සාරාංශයෙ මහජනයාගේ දැනගැනීම සඳහා රජයේ ගැසට් පත්‍රයේ පළ කළ කිරීමට 2019 | මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කළ යුතුය. | මූල්‍ය ප්‍රකාශනවල සාරාංශය ගැසට් පත්‍රයේ පළ කිරීමට ඉදිරි කාලවල දී කටයුතු කෙරේ. |

| | | |
|---|---|---|
| | අගෝස්තු 21 දක්වා කටයුතු කර නොතිබුණි. | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නගර සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,171,996 ක් වූ අතර, ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 14,948,827 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා වූ ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| වරිපනම් හා බදු | 2,000 | 752 | 83 | 2,299 | 3,626 | 1,178 | 411 | 1,579 |
| කුලී | 11,500 | 8,718 | 9,536 | 11,529 | 10,706 | 12,610 | 6,812 | 9,501 |

(අ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු පසුගිය වර්ෂයට වඩා රු.720,000 කින් වැඩි වී තිබුණි. මෙය වරිපනම් බදු අයකිරීමේ මන්දගාමී තත්ත්වය පෙන්නුම් කරයි.

#### 2.2.2 මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කාලපරිච්ඡේදය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් ලැබිය යුතු මුද්දර ගාස්තු අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | මුද්දර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරි කාලවලදී ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අයකිරීමට කටයුතු කරනු ලැබේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යසාධනය

--------------------

නගර සභා ආඥා පනතේ 4 වැනි වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන කාර්යයන් සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) පාරිසරික ගැටළු

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය යටතට වැටෙන කරෙයිච්චි ප්‍රදේශය අවට මහජනයා විසින් බැහැර කෙරෙන කසළ හේතුකොට ගෙන පාරිසරික ගැටළු සිදුව තිබුණි. මේ පිළිබඳ අපගේ පසුගිය වර්ෂයේ වාර්තාවේද සඳහන් කර තිබු නමුත් මේ දක්වා සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය නිසි අයුරින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | ඔබගේ නිරීක්ෂණ අනුව කටයුතු කර වෙනත් ස්ථානවලට බැහැර කිරීමටත්, සභාව රැස්කර බැහැර කිරීමටත් කටයුතු සලසා ඇත. |

(ආ) තිරසාර සංවර්ධන ඉලක්ක

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ප්‍රකාරව එහි අරමුණු හා ඉලක්ක සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. තවද, 2030 වර්ෂයේ ළඟා කරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සභාව සකස් කර ඒ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධනය පිළිබඳ වැඩසටහන් සකස් කර එයට අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | දැනට සභාව විසින් අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස සලකා සහ COPA ක්‍රියාමාර්ගය නිසාත් ඉලක්කයන් හඳුනා ගැනීමට කටයුතු කර ඇත. |

## 3.2 කළමනාකරණ දූර්වලතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අංක පීපී-එල්එල් දරන ටිපර් රථය 2017 දෙසැම්බර් 14 දින අනතුරකට පත්ව තිබුණි. එසේ වුවද, මුදල් රෙගුලසි 104 අනුව විමර්ශන **කමිටු පත්කර** පාඩුවේ වටිනාකම සහ ඊට වගකිව යුත්තන් හඳුනාගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. තවද, විගණන දිනය වූ 2019 අගෝස්තු 21 දින දක්වාම වාහනය අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලසි අනුව කටයුතු කළ යුතුය. | අනතුරට ලක්වූ වාහනය වෙන්දේසි කිරීමට කටයුතු කර ඇති අතර ඉදිරියේදි පාඩු අදාල අයගෙන් අයකර ගැනීමට තීරණය කර ඇත. |
| (ආ) | 2012 වර්ෂයේදී සභාවේ ඡන්ද කොට්ඨාශ 7 න් කොට්ඨාශ 5 ක් තුළ වූ දේපළ බදු තක්සේරු වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සභාවට ලබාදි තිබුණි. එසේවුවද, 1999 වසරේදී සිදුකළ තක්සේරු පදනම් කොටගෙනම වරිපනම් බදු දිගින් දිගට අයකරමින් පැවතුණි. කොට්ඨාශ 02 ක දේපළ තක්සේරු කිරීම මේ දක්වාම සිදුකර නොතිබුණි. | වරිපනම් බදු නිසි අයුරින් තක්සේරු කර අයකිරීමට කටයුතු කළ යුතුය. | තක්සේරු දෙපාර්තමේන්තුවට කිහිප අවස්ථාවකදීම දක්වා තිබුණත්, ඔවුන්ගේ ප්‍රමාදය මීට හේතු විය. වහාම ක්‍රියාත්මක කිරීමට කළමනාකරණ විගණන කමිටුව තීරණය කර ඇත. |
| (ඇ) | කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන නියෝජ්‍යායතනයේ මූල්‍යාධාර මත 2008 වර්ෂයේදී සභාවට පරිත්‍යාග කළ මහන මැෂින් 26 න් මැෂින් 22 ක් සමාලෝචිත වර්ෂය අවසානයේ ක්‍රියා විරහිතව තිබුණි. ඒවා අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් නිසි අයුරින් භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. | මෙම මහන මැෂින් කිහිපයක් කුලියට ලබා දී ආදායම් උපයා ගන්නා අතර අනෙකුත් ඒවා ද අදාළ අරමුණ සඳහා භාවිතා කිරීමට කටයුතු කෙරේ. |
| (ඈ) | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 09/2009(1) දරන 2009 ජුනි 17 දිනැති චක්‍රලේඛයේ (ii) ඡේදය ප්‍රකාරව ආයතන ප්‍රධානියා ඇතුළු රජයේ නිලධාරීන් සියළු දෙනාම තම සේවා ස්ථානවල පැමිණීම සහ පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් තහවුරු කළ යුතු බවට සඳහන් වුවත්, සභාවේ ලේකම්වරයා එලෙස කටයුතු කර නොතිබුණි. | සභාවේ නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් තහවුරු කිරීමට කටයුතු කළ යුතුය. | වැඩ බැලීමේ පත්වීමක් නිසාත් ආයතන දෙකක රාජකාරී කිරීම නිසාත් ඇඟිලි සලකුණු තබා නොමැත. ඉදිරි කාලයේදී ඇඟිලි සලකුණු තැබීමට කටයුතු කෙරේ. |
| (ඉ) | 2015 මැයි 20 දිනැති අංක 11/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 වගන්තිය | කාලය ඉක්ම වූ කාරණාව සඳහා | සභාවේ සේවකයන් දිවා ආහාර විවේකය නිසියාකාරව ක්‍රියාත්මක |

| | | |
|---|---|---|
| ප්‍රකාරව රජයේ කාර්යාලවල කෑම විවේකය විනාඩි 30 ක් පමණි. මෙයට පටහැනිව සභාවේ සේවය කරන සේවකයින් විනාඩි 30 සිට පැය 2.30 කට අධික කාලයක් දිවා ආහාර විවේකය ලබාගැනීම නිරීක්ෂණය විය. මේ නිසා චක්‍රලේඛයට අනුව ඔවුන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම ආයතන ප්‍රධානියාගේ වගකීම වේ. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | කිරීමට කටයුතු යොදා ඇත. එසේම ඉදිරි කාලවලදී ඔබ විසින් සඳහන් කළ කරුණු අනුව කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පසුගිය වසර 08 ක් පුරාම පවතින ගණකාධිකාරී තනතුරේ පුරප්පාඩුව පිරවීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | පළාත් පාලන අමාත්‍යාංශයෙන් කිහිප අවස්ථාවකදීම දැනුම් දී තිබුණත් මේ දක්වා සභාවේ පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 අයිතිය මාරු නොකළ වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වෙනත් ආයතන විසින් සභාවට පරිත්‍යාග කළ වාහන 17 ක් වර්ෂ 12 කට අධික කාලයක සිට සභාව භාවිතා කරනු ලැබේ. එසේවුවත් එම වාහනවල අයිතිය පවරාගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | සභාවේ නමට මාරු කිරීමට කටයුතු කළ යුතුය. | සියළුම වාහන සභාවට පරිත්‍යාග ලෙස ලැබී තිබූ ඒවාය. එයින් කිහිපයක් සභාවේ නමට මාරු කර ඇත. අනෙකුත් ඒවාද මාරු කිරීමට කටයුතු කෙරෙමින් පවතී. |

**3.4.2 නිෂ්කාර්යව පවතින වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ඇති ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීමේ රථය (Gully Bowser) ට්‍රැක්ටර් 02 ක් සහ රෝද දෙකේ යන්ත්‍රය වර්ෂ 05 කට අධික | නිෂ්කාර්යව පවතින වත්කම්වලට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඒවා | තොග සමීක්ෂණ මණ්ඩල සාමාජිකයන්ගේ වාර්තා ලබාගෙන මෙම වාහන ඉවත් |

| | | |
|---|---|---|
| කාලයක සිට භාවිතා නොකර පැවතුණි. මේ අලුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට කටයුතු කර නොතිබුණි. | උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | කිරීමට කටයුතු කර ඇත. |

### 3.5 ප්‍රසම්පාදනය
------------------

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම
---------------------

| විගණන නිරීක්ෂණය<br>--------------------------- | නිර්දේශය<br>---------------- | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>-------------------------- |
|---|---|---|
| 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා සභාව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. | ප්‍රසම්පාදන සැලැස්ම පවත්වාගෙන යා යුතු බව දැනුවත් වී නොතිබූ නමුත් දැන් එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
---------------------------------------

### 4.1 අභ්‍යන්තර විගණනය
------------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------------- | නිර්දේශය<br>--------------- | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>---------------------------- |
|---|---|---|
| සභාවේ සහ පලාත් පාලන අමාත්‍යාංශයේ 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පලාත් පාලන චක්‍රලේඛයේ 8 ඡේදය ප්‍රකාරව නගර සභාව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර කටයුතු කළ යුතුය. | අභ්‍යන්තර විගණනය සඳහා දැන් එක් අයෙකු පත්කර ඇත. ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් වාර්තා ඔබ වෙත යැවීමට කටයුතු කෙරේ. |